**ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව - 2018**

**------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**-----------------------------------**

ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ ("කමිටුව") 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය, අරමුදල් සහ සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ. (කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථිත්වය ඒ සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත)

## 1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

**------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**--------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථිත්වයන් සඳහා වූ (කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කමිටුව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව ක්‍රියාකර ඇති බව,
- ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව, සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| (අ) පිරිවැය රු.12,293,912 ක් වූ පරිගණක සහ උපාංග, ක්‍රීඩා උපකරණ, කාර්යාලීය උපකරණ සහ ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණද, තවමත් භාවිතයේ පවතී. කෙසේ වෙතත්, කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථිත්වයන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතියේ 17 වන වගන්තියේ 19 වන ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන්, ප්‍රමිතයේ 10 වන වගන්තියේ 18 වන ඡේදය ප්‍රකාරව ඇස්තමේන්තුගත දෝෂය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | 2018 වර්ෂයේදී සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ වත්කම් සහ උපකරණ ප්‍රත්‍යගණනය කිරීමට කටයුතු කර නොතිබුණි. | අවම වශයෙන් එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේදීවත් වත්කමක අවශේෂ වටිනාකම සහ ඵලදායී ජීවකාලය සමාලෝචනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ 2 වන වගන්තියේ 52 වන ඡේදයට අනුව, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් කිරීමට ඉඩ දෙන්නේ නම් මිස, එසේ නොකල යුතුය.<br>කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයතුළදී එකතුව රු.189,164 ක් වූ ගෙවිය යුතු ශේෂ 03 ක් එකතුව රු.803,856 ක් වූ වෙළඳ ණය ගැති ශේෂ 25 කට එරෙහිව හිලව් කර තිබුණු අතර එකතුව රු.800,000 ක් වූ දීමනා 3 ක ගෙවිය යුතු ශේෂ, දීමනා වියදම්වලට එරෙහිව හිලව් කර තිබුණි. | 2019 වර්ෂයේදී එය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ 2 වන වගන්තියේ 52 වන ඡේදයට අනුව, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් කිරීමට ඉඩ දෙන්නේ නම් මිස, එසේ නොකල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ ජංගම නොවන වත්කම්වල ජීවිත කාලය අවසන්වී තිබුණද, 2018 දෙසැම්බර් 31 දිනට එය සම්පූර්ණයෙන්ම ක්ෂය කර නොතිබුණි. එබැවින්, 2018 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.5,224,794 ක් වූ ජංගම නොවන වත්කම්, මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණු අතර ක්ෂයවීම දෝෂ සහිතව ගණනය කිරීම හේතුවෙන්, 2018 වර්ෂයේ ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ ජංගම නොවන වත්කම්වල ක්ෂය වීම, මූල්‍ය ප්‍රකාශනවල රු.842,440 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අදහස් සටහන් කරගන්නා ලදි. | ගැටළුව නිරාකරණය කිරීමට කඩිනම් පියවර ගත යුතු අතර මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපුම් කළ යුතුය. |
| (ආ) | 2017 වර්ෂයට අදාළව රු.926,000 ක් වූ වාර්ෂික සාමාජිකත්ව සම්මේලන ප්‍රදානය 2017 වර්ෂයේ ආදායම ලෙස ගැලපීම වෙනුවට 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආදායම ලෙස දක්වා තිබුණි. | අදහස් සටහන් කරගත් අතර ඒවා 2019 වර්ෂයට අනුකූල විය. | මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ 2018 වර්ෂය සඳහා දරන ලද දායකත්වය ගණනය කිරීමේදී රු.1,022,645 ක් වූ ජීවන වියදම් දීමනාව සැලකිල්ලට නොගැනීම හේතුවෙන් එම අරමුදල්වල දායකත්වය පිළිවෙලින් රු.122,717 කින් සහ රු.30,679 කින් අඩුවෙන් දක්වා තිබුණි. | අදහස් සටහන් කරගන්නා ලදි. | සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ දායකත්වය ගණනය කිරීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. |
| (ඈ) | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගිණුම් පොත් අනුව ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව වෙත රු.6,878,916 ක මුදලක් අයවිය යුතුය. කෙසේ වුවද, එය ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ශේෂයක් ලෙස දක්වා නොතිබුණි. | මෙම ශේෂය වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙන එමින් පැවතුණු අතර අප සහ ක්‍රීඩා අමාත්‍යාංශය/ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව අතර අයවිය යුතු ශේෂ නිරවුල් කරගැනීම සඳහා අප විසින් කටයුතු කරමින් පැවතුණි. කෙසේ වුවද, මේ සඳහා කිහිපවරක් ලිඛිතව දැනුම්දීම් කළද, දෙපාර්තමේන්තුවෙන් එම මුදල් ලබාගැනීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපුම් කිරීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. |

### 1.5.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| අයිතමය | මූල්‍ය ප්‍රකාශන අනුව | අනුරූපී වාර්තා අනුව | වෙනස | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙතින් ලැබිය යුතු මුදල් | 640,906 | 10,639,306 | 9,998,400 | මෙම ශේෂය වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙන එමින් පැවතුණු අතර අප සහ ක්‍රීඩා අමාත්‍යාංශය/ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව අතර අයවිය යුතු ශේෂ නිරවුල් කරගැනීම සඳහා අප විසින් කටයුතු කරමින් පැවතුණි. කෙසේ වුවද, මේ සඳහා කිහිපවරක් ලිඛිතව දැනුම්දීම් කළද, දෙපාර්තමේන්තුවෙන් එම මුදල් ලබාගැනීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් සැසඳීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.11,596,940 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.664,763 ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.10,932,177 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමස්ත ආදායම රු.24,688,125 කින් වැඩි වී තිබුණද, සමස්ත වියදම රු.35,195,121 කින් වැඩිවීම මෙම පිරිහීමට හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේදී ජාතික සම්මේලන තිස්තුනක් ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ සාමාජිකයන් ලෙස ලියාපදිංචි වී ඇත. කෙසේ වුවද, සාමාජික සම්මේලන 24 ක් විසින් ලබාදී ඇති වාර්ෂික ප්‍රදානයන්හි එකතුව රු.5,641,000 ක් වූ අතර ශ්‍රී ලංකා ඔලිම්පික් කමිටුව වෙත විධිමත් ලියකියවිලි ඉදිරිපත් නොකළ හෙයින් සාමාජිකයන් 09 දෙනෙකු විසින් 2017 වර්ෂය සඳහා ප්‍රදාන ලබා දී නොමැත. | පූර්ව කමිටුව විසින් අනුගමනය කරන ලද අනුමත ක්‍රියාවලිය වන්නේ ජාතික සම්මේලනය විසින් යම් අවශ්‍යතාවලට අනුකූල වීමත්, වර්ෂය තුලදී ඔවුන්ගේ වාර්ෂික ප්‍රදාන ඉල්ලුම් කළ යුතු වීමත්ය. ජාතික සම්මේලන විසින් ප්‍රදාන ලබාගැනීම සඳහා එක්ව කටයුතු නොකළහොත් ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවට ප්‍රදාන ලබාදිය නොහැක. | ජාතික ක්‍රීඩා කටයුතු සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා ඔලිම්පික් කමිටුවේ සාමාජිකයන් ලෙස ලියාපදිංචි වූ ජාතික සම්මේලනයන් වෙත ප්‍රදාන ලබාදීම සඳහා කඩිනමින් පියවර ගත යුතුය. |
| (ආ) | 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඔලිම්පික් කමිටුවේ ජාතික සාමාජික සම්මේලනයන් 33 අතරින් සාමාජිකයින් 22 දෙනෙක් 2018 වර්ෂය සඳහා එකතුව රු.4,400,000 ක් වූ වාර්ෂික ප්‍රදාන පමණක් ලබාදී ඇති අතර සාමාජිකයින් 5 දෙනෙක් 2017 වර්ෂය සඳහා එකතුව රු.926,000 ක් වූ වාර්ෂික ප්‍රදාන ලබාදී ඇත.<br>කෙසේ වුවද, ශ්‍රී ලංකා ඔලිම්පික් කමිටුව වෙත විධිමත් ලියකියවිලි ඉදිරිපත් නොකළ හෙයින් සාමාජිකයන් 11 දෙනෙකු විසින් 2018 වර්ෂය සඳහා ප්‍රදාන ලබාදී නොමැත. | පූර්ව කමිටුව විසින් අනුගමනය කරන ලද අනුමත ක්‍රියාවලිය වන්නේ ජාතික සම්මේලනය විසින් යම් අවශ්‍යතාවලට අනුකූල වීමත්, වර්ෂය තුලදී ඔවුන්ගේ වාර්ෂික ප්‍රදාන ඉල්ලුම් කළ යුතු වීමත්ය. | ජාතික සම්මේලන සඳහා ප්‍රදාන ලබාදීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.2 නිශ්ක්‍රීය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත සහ උපකරණ

| විගණන නිරීක්ෂණ | කළමණාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| පිළිවෙලින් 1,000,000 ක් සහ රු19,350 ක් වටිනා Olympic Committee of Asia (OCA) Coffee Table Book සහ තාක්ෂණ පාඨමාලා සහතිකපත් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගබඩා භාණ්ඩ ලෙස දක්වා ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, මෙම භාණ්ඩ වර්ෂයකට අධික කාලයක් නිශ්කාර්යව තබා තිබුණි. | එකඟවේ. 2019 වර්ෂයේ ගබඩා භාණ්ඩ තක්සේරුවේදී නිශ්කාර්ය තොග පිළිබඳ ගැටලුව සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. | තොග කළමනාකරණය ඵලදායී ලෙස සිදුකිරීමට කඩිනම් පියවර ගතයුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | කළමණාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| ඔලිම්පික් කමිටුව සඳහා කාර්ය මණ්ඩලයක් පත්කරනු පිණිස විධායක කමිටුව විසින් අනුමත කරන ලද විධිමත් බඳවාගැනීමේ පරිපාටියක් සකස්කර නොතිබුණ අතර ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ සේවක සංඛ්‍යාව විධායක කමිටුව විසින් අනුමත කර නොතිබුණි. | අප විශාල ලෙස ලාබ උපයන මෙහෙයුම් සිදු නොකරන හෙයින් පිරිවැටුම අවම මට්ටමක තබාගනු පිණිස අවම කාර්යමණ්ඩලයකින් කටයුතු පවත්වාගෙන යනු ලැබේ. ඉදිරියේදී ක්‍රියාත්මක කරනු ලබන /දැනට පවත්නා ව්‍යාපෘති සඳහා අවශ්‍ය පරිදි සහ අවශ්‍ය වූ විට තක්සේරුවක් සිදු කොට අවශ්‍ය බඳවාගැනීම් සිදු කරනු ලැබේ. | ඵලදායී මානව සම්පත් කළමනාකරණයක් සඳහා අනුමත බඳවාගැනීම් පරිපාටියක් සහ කාර්යමණ්ඩලයක් සකස් කළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | කළමණාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව විසින් 2018 වර්ෂය සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයක් පිළියෙළ කර තිබුණද විධායක කමිටුව විසින් එය අනුමත කර නොතිබුණි. තවද, ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව විසින් 2018 වර්ෂය සඳහා ප්‍රසම්පාදන | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළියෙල කර 2019 වර්ෂයේදී ඒ සඳහා විධායක කමිටුවේ අනුමැතිය ලබාගෙන ඇත. තවද, අපවිසින් 2020 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කරන ලද අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුමතකර ගැනීමට, ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කිරීමට, සහ ප්‍රසම්පාදන සීමාවන් නිශ්චය කිරීමට කඩිනමින් ක්‍රියා |

| | | |
|---|---|---|
| සැලැස්මක් සකස්කර නොතිබුණි. එමෙන්ම ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ 2018 වර්ෂය සඳහා වන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අනුමත කරනු ලබන ප්‍රසම්පාදන සීමා නිශ්චය කර නොතිබුණි. | ප්‍රසම්පාදන සීමාවන් ද නිශ්චය කරන ලදී. එය 2019 වර්ෂයේ දී අනුමත කරන ලදී. | කළයුතුය. |

**4.** **ගිණුම් කටයුතු භාවය සහ යහ පාලනය**

**4.1** **සංයුක්ත සැලැස්ම**

| **විගණන නිරීක්ෂණ** | **කළමණාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශ** |
|---|---|---|
| සංයුක්ත සැලැස්ම තුල කමිටුවේ අනාගත දිශානතිය නිශචය කරන ක්‍රමෝපායන් ඇතුළත් විය යුතුය. නමුත් තාත්වික සහ ඉටුකරගත හැකි ඉලක්ක අන්තර්ගතවන පරිදි සංයුක්ත සැලැස්මක් කමිටුව විසින් පිළියෙල කර නොතිබුණි. | අපගේ ක්‍රමෝපා සැලසුම් සකස් කරනු පිණිස ක්‍රමෝපා සැලසුම් සැසියක් පැවැත්වීමට 2020 වර්ෂයේ අයවැය තුළ ප්‍රතිපාදන සලසා ඇත. | කමිටුවේ අනාගත දිශානතිය ඇතුළත් වන පරිදි සංයුක්ත සැලැස්මක් පිළියෙල කිරීමට වහා පියවරගත යුතුය. |

4.2 **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| **විගණන නිරීක්ෂණ** | **කළමණාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශ** |
|---|---|---|
| නිශ්චිතව සඳහන්කර ඇති කාලසීමාවක් ඇතුළත ඉටුකරගතහැකි ඉලක්ක සහ අරමුණු ඇතුළත් කරමින් 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | අප විසින් ඊලඟ වර්ෂයේ සිට ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කරනු ඇත. | ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමට කඩිනමින් පියවර ගත යුතුය. |